# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 64 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 64 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 8/84.

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 64 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— 1981 අංක 57 දරන පනතේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"III වන කොටස යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධ්‍යක්ෂවරයා විසින් දිසාපතිවරයාට සහ වෙනත් නිලධරයන්ට පැවරිය හැකි බව.

5. අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ විට සහ අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, මේ පනතේ III වන කොටසින් අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද නැතහොත් වෙන් කරන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය හෝ ඉන් කිසිවක් හෝ වෙරළ කලාපයේ යම් කොටසක් පිහිටියේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා හෝ රුපියල් 24,000/- ක හෝ ඊට වැඩි වාර්ෂික වැටුප් ක්‍රමයක් ඇති සහ වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 600/- ක් වන හෝ ඊට වැඩි වන වෙනත් යම් රාජ්‍ය නිලධරයකු හෝ විසින් ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) යටත් පිරිසෙයින් සෑම මාස හයකට වරක් හෝ සභාවේ රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 27අ වන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

"14 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කළ විට වාහන ආදිය අත් අඩංගුවට ගැනීම.

27අ. (1) 14 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් යම් වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක්, නැවක්, යන්ත්‍රයක් හෝ උපකරණ පාවිච්චි කරනු ලැබූ අවස්ථාවක, එම වාහනය, යාත්‍රාව, බෝට්ටුව, නැව, යන්ත්‍රය හෝ උපකරණය ඒවා ඇතුළත තිබුණු යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ද සමඟ අත් අඩංගුවට ගැනීමට යම් පොලිස් නිලධරයකුට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අත් අඩංගුවට ගනු ලැබූ කිසිම වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක්, නැවක්, යන්ත්‍රයක් හෝ උපකරණයක් මුදා හැරීම, ඒ මුදාහැරීමට අවසර දෙන අධිකරණ ආඥාවක් ලබාගෙන ඇත්නම් මිස, කරනු නොලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ විට—

(අ) ඒ වරද කරනු ලැබුවේ රජයේ දේපළ නොවන යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ ද්‍රව්‍යය හෝ භාණ්ඩය ; සහ

(ආ) ඒ වරද කිරීමේ දී හෝ කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද්දා වූ ද සියලු වාහන, යාත්‍රා, බෝට්ටු, නැව්, යන්ත්‍ර සහ වෙනත් උපකරණ (ඒ වාහන, බෝට්ටු, නැව්, යන්ත්‍ර ඒ තැනැත්තාට අයත් වුව ද නොවුව ද)

ඒ වරදකරු කරනු ලැබීම හේතු කොට ගෙන රාජසන්තක බව ප්‍රකාශ කරමින් මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (2) උපවගන්තිය යටතේ රාජ සන්තක කරනු ලැබූ යම් දේපළක්—

(අ) අදාළ වරදකරු කරනු ලැබීමට එරෙහිව කිසිම අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර නොමැති නම්, ඒ වරදකරු කරනු ලැබීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ නියමිත කාලසීමාව ඉකුත්වන දින පටන් නියත වශයෙන්ම රජය සතු විය යුතු ය ;

(ආ) අදාළ වරදකරු කරනු ලැබීමට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත් නම්, ඒ වරදකරු කරනු ලැබීම අභියාචනයේ දී ස්ථිර කරනු ලැබූ දින සිට නියත වශයෙන්ම රජය සතු විය යුතු ය.

මේ උපවගන්තියේ " අදාළ වරදකරු කරනු ලැබීම " යන්නෙන්, (1) වන උපවගන්තිය යටතේ යම් දේපළක් රාජ සන්තක කිරීමේ ප්‍රතිඵලයක් ඇති වූ වරදකරු කරනු ලැබීම අදහස් වේ:

එසේ වුව ද, එම වරද කරනු ලැබුවේ යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් සම්බන්ධයෙන් ද එම ද්‍රව්‍යය හෝ භාණ්ඩය හෝ ඒ වරද කිරීමේ දී හෝ කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක්, නැවක්, යන්ත්‍රයක් සහ වෙනත් උපකරණයක් හෝ එම වරදකරු කරනු ලැබූ තැනැත්තා නොවන වෙනත් තැනැත්තකුට අයිති බව ඔප්පු කරනු ලැබුවහොත් සහ,

එම වරද සම්බන්ධයෙන් හෝ එම වරද කිරීමෙහි ලා එය පාවිච්චි කරන බව තමා නොදැන සිටි බවට ඒ අනෙක් තැනැත්තා විසින් අධිකරණය සෑහීමට පත් කරනු ලැබුවහොත්, එම ද්‍රව්‍යය, භාණ්ඩය, වාහනය, යාත්‍රාව, බෝට්ටුව, නැව, යන්ත්‍රය සහ උපකරණය මුදා හැරීමේ ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියෙහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉ) 31 අ(1) හෝ 31ඇ හෝ වගන්තියෙහි විධිවිධාන කඩ කරත හොත් ;".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(5) මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති පරිදි යම් ඉදිකිරීමක්, නිවසක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට, යම් අවහිරයක් හෝ ප්‍රතිරෝධයක් සිදු වී ඇති නිසා හෝ සිදුවිය හැකි නිසා අධ්‍යක්ෂවරයාට නොහැකි වන්නා වූ හෝ ඔහුට නොහැකි වේ යයි බලාපොරොත්තු වන්නා වූ හෝ අවස්ථාවක, ඉදිකිරීම, නිවස, පැල, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ල පිහිටියා වූ ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉදිකිරීම, නිවස, පැල, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ල කඩා ඉවත් කළ යුතු යයි පිස්කල්වරයා විධාන කෙරෙන ඒ අධිකරණයේ ආඥාවකට අධ්‍යක්ෂවරයාට හිමිකම ඇත්තේ ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල්වරයා වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ ආඥාව වහාම ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු අතර, ඒ ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබූ ආකාරය පිළිබඳව එම අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කරනු ලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම ප්‍රඥප්තියෙහි 31අ, 31ආ, 31ඇ, 31ඈ, 31ඉ සහ 31ඊ යන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ, 31ආ, 31ඇ, 31ඈ, 31ඉ සහ 31ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"වෙරළ කලාපය ඇතුළත හිරිගල් කැණීම, එකතු කිරීම ආදිය තහනම් කිරීම.

31අ. (1) වෙරළ කලාපය තුළ කිසිම තැනැත්තකු විසින්—

(අ) හිරිගල් කැණීම, එකතු කිරීම, ළඟ තබා ගැනීම, පිරිසැකසුම් කිරීම, ගබඩා කිරීම, පිළිස්සීම සහ ප්‍රවාහනය කිරීම කිසිදු ආකාරයකින් නොකළ යුතු ය;

(ආ) හිරිගල් පිළිස්සීම සහ පිරිසැකසුම් කිරීම සඳහා පෝරනුවල හිමිකම් ඇරීම, සන්තකය ඇරීම, පරිහරණය කිරීම, පෝරනු කුලියට දීම, බද්දට දීම, හෝ පවත්වා ගෙන යාම නොකළ යුතු ය;

(ඇ) හිරිගල් කැණීමේ කාර්ය සඳහා යම් උපකරණයක්, යන්ත්‍රයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් භාවිතා කිරීම හෝ සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය; තවද

(ඈ) හිරිගල් කිසිවක් කැණීමේ දී හෝ ඒවා ප්‍රවාහනය කිරීමේ දී සහ ඒ සම්බන්ධයෙන් යම් වාහනයක්, යාත්‍රාවක්, යානයක් හෝ බෝට්ටුවක් භාවිතා නොකළ යුතු ය:

එසේ වුවද, අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ, විද්‍යාත්මක පර්යේෂණ කාර්යය සඳහා හිරිගල් ඉවත් කිරීමේ අවසරය දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානයන් උල්ලංඝනය කරමින් යම් වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක්, නැවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක දී එම වාහනය, යාත්‍රාව, නැව, බෝට්ටුව හෝ යන්ත්‍රය ඒවා ඇතුළත තිබූ යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ද සමග අත් අඩංගුවට ගැනීමට යම් පොලිස් නිලධරයකුට බලය තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අත් අඩංගුවට ගනු ලැබූ කිසිම වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක්, නැවක් හෝ යන්ත්‍රයක් මුදා හැරීම, ඒ මුදා හැරීමට අවසර දෙන අධිකරණ ආඥාවක් ලබාගන්නේ නම් මිස, කරනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් වෙරළ කලාපය ඇතුළත ගබඩා කර හෝ එකතු කර සම්බ වන හිරිගල් රාජසන්තක කිරීමට ඕනෑම පොලිස් නිලධරයකුට බලය තිබිය යුතු ය. එසේ සම්බ වන හිරිගල්, අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ නියෝජිතයාට හෝ භාරදිය යුතු ය. නැතහොත් අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට බැහැර කළ යුතු ය.

වරද සිදු කරනු ලැබූ ස්ථානය පිළිබඳව අධ්‍යක්ෂවරයාගේ සහතිකය මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

31ආ. 31අ වන වගන්තියෙහි සඳහන් කරනු ලැබ ඇති ක්‍රියා සිදු වූයේ වෙරළ කලාපය ඇතුළත බවට ප්‍රකාශයක් ඇතුළත්ව, අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

වෙරළ කලාපය තුළ පිහිටි පෝරනු කඩා දැමීම.

31ඇ. වෙරළ කලාපය තුළ පෝරනු එකක් හෝ ඊට වැඩි ගණනක් අයත් හෝ ඒවායේ සන්තකය දරන හෝ ඒවායේ පදිංචිව සිටින සෑම තැනැත්තකුම මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දින සිට දින තිහක් ඇතුළත එම පෝරනු කඩා දැමීම හෝ එම පෝරනු කඩා දැමීමට සැලැස්වීම කළ යුතු ය.

සන්තකය දැරීමෙන් හෝ භාවිතයෙන් වැල්ලේ අයිතිය අත්කර ගත නොහැකි බව.

31ඇ. (1) කිසිම තැනැත්තකු විසින් වැල්ලේ යම් නිශ්චිත කොටසක් සන්තකය දැරීමේ හෝ භාවිතා කිරීමේ හේතුවෙන් රජය වෙතින් එම වැල්ලේ කොටසෙහි අයිතිය අත්කර ගැනීම සඳහා හිමිකම් පෑම නොකළ යුතු ය.

(2) (අ) දිවයිනේ යම් කොටසක වූ වැල්ල සම්බන්ධිත වන ප්‍රදේශය සම්බන්ධයෙන් ඇතිවන යම් ආරාවුලක දී, යම් නිශ්චිත ප්‍රදේශයක් වැල්ලේ කොටසක් වන බවට ප්‍රකාශයක් ඇතුළත් වන, අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද තැනැත්තකු විසින් හෝ අත්සන් තබන ලද සහතිකයක් එම සහතිකයේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් මූල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වූ සහතිකයක් නිකුත් කිරීමේ කාර්ය සඳහා තීරණයකට එළඹීමේ දී වෙරළ ඉම දිගේ ඇති ප්‍රදේශවල සිට වෙරළබඩ ප්‍රවාහනයෙන් එනු ලැබූ වැලි ගොඩ ගැසීමෙන් සහ ගංගා දිගේ ද්‍රව්‍ය ප්‍රවාහනයෙන් වෙරළ ඉම දිගේ එකතු වන ප්‍රමාණය, අධ්‍යක්ෂවරයා, හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) මේ පනතේ කාර්ය සඳහා, පෞද්ගලික දේපළට යාබදව සිදු වී ඇති එකතු වීම් රජයට අයත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, වැල්ලේ යම් කොටසක් භාවිතා කිරීමේ හෝ එහි ප්‍රයෝජනය ලැබීමේ අයිතිය මහජනයාට තිබිය යුතු ය.

**වැලි සහ සිප්පි කටු ප්‍රවාහනය කිරීම.**

31ඉ. (1) වැලි සහ සිප්පි කටු ප්‍රවාහනය කරන හෝ ප්‍රවාහනය කරන්නේ යැයි සැක කරන කවර හෝ වාහනයක්, යාත්‍රාවක්, බෝට්ටුවක් හෝ නැවක් පරීක්ෂා කිරීමට කවර හෝ පොලිස් නිලධරයකුට බලය ඇත්තේ ය.

(2) එම වැලි හෝ සිප්පිකටු නීත්‍යානුකූලව ලබා ගත් බව ඔප්පු කිරීමේ භාරය එම වැලි හෝ සිප්පි කටු ප්‍රවාහනය කරන තැනැත්තා සතු වන්නේ ය.

**දඩ මුදල් වලින් සියයට පණහක් පොලිස් ත්‍යාග අරමුදලට බැර කළ යුතු බව.**

31ඊ. දඩමුදල් වශයෙන් ලැබෙන මුදල්වලින් සියයට පණහක් පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද පොලිස් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ, 35ආ සහ 35ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා එම ප්‍රඥප්තියේ 35අ, 35ආ සහ 35ඇ යන වගන්ති වශයෙන් බල පැවැත්විය යුතු ය :—

**"පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමේ බලය.**

35අ. (1) මේ පනත යටතේ වූ මාස හයකට වැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සිදු කිරීමෙහි ලා හෝ ඊට සම්බන්ධයක් ඇතැයි හෝ සැක කිරීමට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකු විසින් ස්වකීය නම සහ ලිපිනය දීමට ප්‍රතික්ෂේප කරයි නම් හෝ සාවද්‍ය බවට විශ්වාස කිරීමට යම් පොලිස් නිලධරයකුට හේතු ඇති නමක් සහ ලිපිනයක් ඉදිරිපත් කරයි නම් හෝ එම තැනැත්තා සැඟවී සිටීමට හැකි බවට විශ්වාස කිරීමට හේතු ඇත් නම් හෝ මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් නොමැතිව සහ වරෙන්තුවක් නොමැතිව යම් පොලිස් නිලධරයකු විසින් ඒ තැනැත්තා අත් අඩංගුවට ගත හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අත් අඩංගුවට ගැනීමක් සිදු කරන සෑම පොලිස් නිලධරයකු ම, සැක කරුට චෝදනා ඉදිරිපත් කරනු ලැබ ඇති වරද සඳහන් කරන ප්‍රකාශයක් ද සමග, අනවශ්‍ය ප්‍රමාද යක් නොමැතිව, අත් අඩංගුවට ගනු ලැබූ තැනැත්තා ළඟම ඇති පොලිස් ස්ථානය වෙත රැගෙන යා යුතු ය. නැතහොත් පිටත් කර යැවිය යුතු ය.

පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව අත් අඩංගුවට ගනු ලැබූ තැනැත්තා ළඟම සිටින මහෙස්ත්‍රාත්වරයා වෙත රැගෙන යා යුතුය. නැතහොත් පිටත් කර යැවිය යුතු ය.

වරද සිදු කිරීම වැළැක්වීමට පොලිස් නිලධරයා සතු බලය.

35ආ. සෑම පොලිස් නිලධරයකු විසින් ම මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීම වැළැක්විය යුතු ය. තව ද මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්ය සඳහා මැදිහත් විය හැකි ය.

පොලිස් නිලධරයන්ට බාධා කිරීම හෝ ඔවුන් ගේ කටයුතු වලට මැදිහත් වීම සඳහා වන දණ්ඩනය.

35ඇ. මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී යම් පොලිස් නිලධරයකුට හෝ ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකුට හෝ තර්ජනය කරන, භය ගන්වන හෝ බාධා කරන හෝ නැතහොත් වළක්වන හෝ ඔවුන්ගේ කටයුතු වලට මැදිහත් වන ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය :

එසේ වුව ද පොලිස් අධිකාරීවරයකුගේ නිලයට අඩු නොවන නිලයක නිලධරයකුගේ අනුමතිය ඇතිව මිස, මේ වගන්තිය යටතේ නඩු පැවරීමක් නොකළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) “වෙරළ” යන යෙදුමේ අර්ථකථනයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

‘“වැල්ල” යන්නෙන් ඒකාබද්ධ නොවූ ද්‍රව්‍යවලින් සමන්විත වූ ද ප්‍රධාන වශයෙන් වැලිවලින් සමන්විත වූ ද මධ්‍ය වඩදිය ඉමේ සිට ද්‍රව්‍යවල ප්‍රධාන වෙනසක් ඇති ප්‍රදේශය තෙක් හෝ ස්වභාවික භූ-රූපණ ප්‍රදේශය තෙක් හෝ නිත්‍ය වෘක්ෂලතා ජීවිත තෙක් හෝ ගොඩබිම දෙසට විහිදෙන සුළු බෑවුමක් සහිත ප්‍රදේශය ඇතුළත් වේ. ද්‍රව්‍යවල හෝ ස්වාභාවික භූ-රූපණයේ ප්‍රධාන වෙනසක් නොමැති අවස්ථාවල දී මධ්‍ය වඩදිය ඉමේ මට්ටමේ සිට මීටර් 20 ක් හෝ මධ්‍ය වඩදිය ඉමේ මට්ටමට ඉහළින් මීටර් 2.5 ක් හෝ යන දෙකෙන් වඩා අඩු දුර ප්‍රමාණය තෙක් වැල්ල විහිදී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද

(2) "සංවර්ධන කාර්යය" යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

'"සංවර්ධන කාර්යය" යන්නෙන්, කවර හෝ ආකාරයකින් වෙරළ කලාපයේ භෞමික ස්වභාවය වෙනස් කිරීමට ඉඩ ඇති යම් කාර්යාවලියක් අදහස් වන අතර, ගොඩනැගිලි සහ කර්මාන්ත ඉදිකිරීම, බෝයවලින් යාත්‍රාවලින් හෝ වෙනත් මාර්ග වලින් අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය තැන්පත් කිරීම, ස්වභාවික වාක්ෂලතාදිය වැලි සහ සිප්පිකටු මුහුදු පැලෑටි හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම, හෑරීම සහ පිරවීම ඉඩම් ප්‍රතිසංස්කරණය සහ ඛණිජ ද්‍රව්‍ය සඳහා කැණීම හෝ හෑරීම ඊට ඇතුළත් වන නමුත්, මසුන් ඇල්ලීම ඊට ඇතුළත් නොවේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 286 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා එවා ලබාගත හැකිය.